# ඉස්ලාම්

## 2 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

පළමුවන මුද්‍රණය - 2016
දෙවන මුද්‍රණය - 2017
තුන්වන මුද්‍රණය - 2018
සිව්වන මුද්‍රණය - 2019
පස්වන මුද්‍රණය - 2020

සියලු හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0226-2

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
මත්තේගොඩ, වාසනාවත්ත පාර, නො. 90 දරන ස්ථානයෙහි පිහිටි
විශ්ව ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by : Educational Publications Department
Printed by : Vishwa Graphics (Pvt) Ltd.

## ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්‍ය වඩවමින රැගෙනයනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

මනුගුණදම් සුරකින්නට නිති කැපවුණු කුසලතා පිරි මනුෂ්‍ය වර්ගයාට මේ ලෝකය වඩාත් සොඳුරු බිමක් බවට පත් කළ හැකි ය. ඒ සඳහා රටක අධ්‍යාපනය නිරතුරුවම බලසම්පන්න කරගතයුතු වන්නේ අනාගත වැඩලොව පිළිබඳව ද මනා අවදියෙන් සිටිමිනි. දිනෙන් දින විශ්ව ගම්මානය වෙත එක්වන සාරවත් නව දැනුම අපේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සමඟ මුසුකර ගැනීම අනිවාර්යයෙන් සිදුවිය යුතු අතරම අපගේ යහගුණදම් ද ඒ හා ඒකාත්මික කරගන්නට අමතක නොකළ යුතු ය. මෙම සාධනීය ගුණාංග රැකගනිමින් වඩාත් යහපත් සිසු පරපුරක් නිර්මාණය කිරීමේ උත්කෘෂ්ට මෙහෙවරට අවැසි ගුණාත්මක ඉගෙනුම් ආධාරක සම්පාදනය කිරීම අප දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ පරමාර්ථය බව අවධාරණය කරමි.

නේක විසිතුරු සිත්තම් හා අකුරුවලින් සපිරි මේ පෙළපොත් අනාගත ලොවට මඟ එළි දල්වන ප්‍රදීපස්තම්භ බඳු ය. ඔබ පාසල් බිමෙන් සමුගත් දිනක වුව, තුටින් සිහි කළ හැකි මිහිරි මතක, මේ පාඩම් පොත් පිටු අතර රැඳී තිබෙනු නිසැක ය. ගුරු තරුවල නොමඳ ආලෝකය ලබා ගනිමින් ඔබ මේ දැනුම හා වින්දනය කැටිකළ අනගි ත්‍යාගයෙන් නිසි පල නෙළා ගත යුත්තේ තව තවත් දැනුම් අවකාශ වෙත යුහුසුලුව පියමනිමිනි. රජය පෙළපොත් වෙනුවෙන් වැය කළ අප්‍රමාණ වූ ධනස්කන්ධයට අමිල අගයක් ලබා දිය හැක්කේ පාසල් සිසු දරු දැරියන් වූ ඔබට පමණි. දිවිය වෙත හඹා එන අනේක බාධක දිරියෙන් ජයගෙන, හෙට ලොව සුපුෂ්පිත කරවන්නට දැයේ දරුදැරියන්ට හැකිවේවායි අප්‍රමාණ ස්නේහයෙන් ආශිර්වාද කරන්නෙමි.

පෙළපොත් සම්පාදන ක්‍රියාවලිය වෙනුවෙන් මනා කැපවීමකින් සම්පත්දායකත්වය සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සැමටත් මාගේ හදපිරි ස්තුතිය පිරිනමමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2020.06.26

## නියාමනය හා අධීක්ෂණය

**පී. එන්. අයිලප්පෙරුම**
**අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

## මෙහෙයවීම

**ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි**
**අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන),**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

## සම්බන්ධීකරණය

**එම්. ටී. අබ්දුර් රහ්මාන්**
**සහකාර කොමසාරිස්,**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**අයි. ඒ. එම්. අෆ්සාන්**
**සහකාර කොමසාරිස්,**
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

## ලේඛක මණ්ඩලය

**එස්. එම්. ආර්. සුදීන්**
**ගුරු අධ්‍යාපනඥ,**
සහිරා විද්‍යාලය කොළඹ 10.

**එම්. එම්. ඒ. බිස්තාමි**
**උප ගුරු,**
අල් මුබාරක් ප්‍රාථමික විද්‍යාලය,මල්වාන.

**එස්. ඒ. සී. එම්. කරාමත්**
**විශ්‍රාමලත් විදුහල්පති.**

## සංස්කාරක මණ්ඩලය

**ඉසෙඩ්. තාජුදීන්**
**අධ්‍යක්ෂ,**
මුස්ලිම් පාසල් සංවර්ධන අංශය,
අධ්‍යාපන අමාත්‍යාංශය.

**ජේ. එම්. ජසාර්**
**කථිකාචාර්ය, ආගමික ඒකකය,**
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

**එම්. එච්. එම්. නාලිර්**
**සම්පත් පුද්ගල,**
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
**ජ්‍යෙෂ්ඨ ගුරු** (විශ්‍රාමලත්).

**ඒ. අබ්දුල් සමදු**
**විදුහල්පති,**
අ/සාහිරා මහා විද්‍යාලය, අනුරාධපුර.

## අවසාන ඇගයීම

**එම්. ආර්. එම්. ඉර්ෂාන්**

නියෝජ්‍ය අධ්‍යක්ෂ,
(ජාතික පාසල් ඒකකය)
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය,
බත්තරමුල්ල.

**එල්. ඒ. යූ. බී. අතුකෝරල**

හිටපු කථිකාචාර්ය,
සිංහල අධ්‍යයන අංශය,
කොළඹ විශ්වවිද්‍යාලය.

## පිටු සැකසුම

**එච්. එෆ්. රිස්නා**

**පරිගණක අංශය,**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

## පරිගණක සහායක

**එස්. ඒ. අස්රිනා**

**පරිගණක අංශය,**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

## චිත්‍ර හා පිටකවර නිර්මාණය

**චිත්‍ර ශිල්පී එම්. ජේ. එම්. මන්සූර්**

**නියෝජ්‍ය විදුහල්පති,**

විද්‍යාලෝක මහා විද්‍යාලය, බලංගොඩ.

# පටුන


| | | |
|---|---|---|
| 1. | මැවුම්කරු අල්ලාහ් | 1 |
| 2. | අල්ලාහ් සිහි කරමු | 3 |
| 3. | ආමන්තු බිල්ලාහි | 6 |
| 4. | මලක්වරු ඊමාන් කරමු | 8 |
| 5. | බුනියල් ඉස්ලාම් | 10 |
| 6. | කලිමා ෂහාදා | 11 |
| 7. | අල් අදාන් | 12 |
| 8. | පිරිසිදුව සිටිමු | 14 |
| 9. | පිරිසිදු කරමු | 18 |
| 10. | යහපත් පිළිවෙත් පුරුදු වෙමු | 21 |
| 11. | පන්ති කාමරයේ පිරිසිදුකම සුරකිමු | 24 |
| 12. | හොඳ පුරුදු පිළිපදිමු - I | 27 |
| 13. | හොඳ පුරුදු පිළිපදිමු - II | 30 |
| 14. | ආදරයෙන් සලකමු | 34 |
| 15. | ආලිම්වරු | 37 |
| 16. | ගුරුවරයා | 39 |
| 17. | ආදර්ශමත් දරුවා | 41 |
| 18. | උදවු කරමු | 43 |
| 19. | මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා | 46 |
| 20. | අවසාන දේව ධර්ම දූතයාණෝ | 48 |
| 21. | සියල්ලන්ගේ ම දේව ධර්ම දූතයාණෝ | 49 |
| 22. | යහපත් ගුණාංග | 51 |
| 23. | සූරතුල් ඉඛ්ලාස් | 53 |
| 24. | මස්ජිද් - I | 55 |
| 25. | මස්ජිද් - II | 57 |
| 26. | ඉමාම් අබ්දුල් කාදිර් ජීලානි රහ්මතුල්ලාහි අලෛහි | 59 |

# 1 මැවුම්කරු අල්ලාහ්

අහස මැව්වේ අල්ලාහ් ය.

පොළොව මැව්වේ ද අල්ලාහ් ය.

අහස සහ පොළොව අතර ඇති සියල්ල මැව්වේ ද අල්ලාහ් ය.

ඒ සියල්ල පාලනය කරන්නා ද අල්ලාහ් ය.





ඔහු رَبُّ الْعٰلَمِيْنَ (රබ්බුල් ආලමීන්) වන්නේය.

سُبْحَانَ اللّٰه සුබ්හානල්ලාහ්!

## අභ්‍යාස

ගැළපෙන වචන යොදා හිස්තැන් පුරවන්න.

(හිරු, ගස්, කඳු, සඳු)

01. අහසේ ඇති අල්ලාහ්ගේ මැවීම් දෙකක්

1. ...................... 2. ..............................

02. පොළොවෙහි ඇති අල්ලාහ්ගේ මැවීම් දෙකක්

1. ..................... 2. ..............................

# 2 අල්ලාහ් සිහි කරමු

අපට ජීවත් වීමට

ආහාර අවශ්‍ය ය.



වාතය අවශ්‍ය ය.

ජලය අවශ්‍ය ය.



අනෙක් ජීවීන්ට ද මේවා අවශ්‍ය ය.
මේ සියල්ල මවන ලද්දේ අල්ලාහ් ය.
මේ සියල්ල ඔහුගෙන්ම ඉල්ලමු.

**සෑම විට ම අල්ලාහ් සිහි කරමු.**
**ඔහුට තුති පුදමු.**

## අභ්‍යාස

පිළිතුරු සපයන්න.

1. අපට ජීවත්වීමට අල්ලාහ් ලබා දුන් දේවල් ලියන්න.
   අ) ආහාර
   ආ) ................................
   ඇ) ................................

2. අල්ලාහ් අපට ලබා දී ඇති ආහාර වර්ග 05ක් ලියන්න.
   අ) ................................
   ආ) ................................
   ඇ) ................................
   ඈ) ................................
   ඉ) ................................

# 3 ආමන්තු බිල්ලාහි

اٰمَنْتُ بِاللّٰهِ وَمَلَائِكَتِهِ وَكُتُبِهِ وَرُسُلِهِ وَالْيَوْمِ
الْأٰخِرِ وَالْقَدْرِ خَيْرِهِ وَشَرِّهِ مِنَ اللّٰهِ تَعَالٰى

ආමන්තු බිල්ලාහි වමලාඉකතිහි වකුතුබිහි
වරුසුලිහි වල් යවුමිල් ආහිරි වල් කද්රි හයිරිහි
වෂර්රිහි මිනල්ලාහි තආලා.

1 අල්ලාහ් විශ්වාස කළෙමි.

2 මලක්වරු විශ්වාස කළෙමි.

3 දේව ග්‍රන්ථ විශ්වාස කළෙමි.

4 රසූල්වරු විශ්වාස කළෙමි.

5 අවසාන දිනය විශ්වාස කළෙමි.

6 කලා කද්රය විශ්වාස කළෙමි.

මේවා විශ්වාස කර ජීවත් වෙමු

## අභ්‍යාස

අප විශ්වාස කළ යුතු පහත සඳහන් කරුණු හය පිළිවෙළින් ලියන්න.

(රසූල්වරු, මලක්වරු, අල්ලාහ්, කලා කද්ර්, දේව ග්‍රන්ථ, අවසාන දිනය)




## ක්‍රියාකාරකම

"ආමන්තු බිල්ලාහි..." යන වැකිය පාඩම් කර කියන්න.

# 4 මලක්වරු ඊමාන් කරමු

මලක්වරු මවනු ලැබුවේ ආලෝකයෙනි.

අපට ඔවුන් දැකිය නොහැකි ය.

එහෙත් ඔවුනට අපව දැක ගත හැකි ය.

ඔවුන්ගෙන් ප්‍රධාන මලක්වරු දස දෙනෙකු සිටිති.

ඔවුන්ගෙන් හතර දෙනෙකුගේ නම් හා රාජකාරි දැන ගනිමු.

1. ජිබ්රීල් අලෛහිස්සලාම්
   අල්ලාහ්ගේ පණිවුඩය ගෙන එන්නා

2. මීකායීල් අලෛහිස්සලාම්
   ආහාර, වර්ෂාව, සුළඟ වැනි දේ පාලනය කරන්නා

3. ඉස්රායීල් අලෛහිස්සලාම්
ජීවය අත්පත් කරන්නා

4. ඉස්රාෆීල් අලෛහිස්සලාම්
සූර් පිඹින්නා

## මලක්වරු ඊමාන් කරමු.

### අභ්‍යාස

ප්‍රධාන මලක්වරු හතර දෙනෙකුගේ නම් ලියන්න.

1. ..............................................................

2. ..............................................................

3. ..............................................................

4. ..............................................................

# 5 බුනියල් ඉස්ලාම්
## بُنِيَ الْإِسْلَامُ

ඉස්ලාම් කරුණු පහක් මත ගොඩනැගී ඇත. ඒවා නම්,

| | |
|---|---|
| 1. සාක්ෂි කීම. (කලිමා උසුරීම) | الشَّهَادَةُ |
| 2. සලාතය ඉටු කිරීම. | الصَّلَاةُ |
| 3. සකාත් දීම. | الزَّكَاةُ |
| 4. සව්මය රැකීම. | الصَّوْمُ |
| 5. හජ් ඉටු කිරීම. | الْحَجُّ |

### ක්‍රියාකාරකම

ඉහත කරුණු පහ කටපාඩම් කර කියන්න.

# 6 කලිමා ෂහාදා

أَشْهَدُ أَنْ لاَإِلٰهَ إِلاَّ اللهُ وَحْدَهُ لَا شَرِيكَ لَهُ
وَ أَشْهَدُ أَنَّ مُحَمَّداً عَبْدُهُ وَرَسُوْلُهُ

අෂ්හදු ඇන් ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීක ලහු
වඅෂ්හදු ඇන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු.

අල්ලාහ් හැර නැමදීමට වෙන සුදුස්සෙකු නැතැයි සාක්ෂි දරමි. ඔහු ඒකයකි. ඔහුට සමාන කිසිවකු නැත. තව ද මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අල්ලාහ්ගේ ගැත්තකු බව ද, අල්ලාහ්ගේ රසූල්වරයා බව ද, සාක්ෂි දරමි.

## ක්‍රියාකාරකම

කලිමා ෂහාදාව කට පාඩම් කරන්න.

# 7 අල් අදාන්
## الأَذَان

අදාන් කියන විට

නිහඬව සිටිමු.

එයට සවන් දෙමු.

සලාතයට යමු.



අදාන් කියන්නා "මුඅද්දින්" යනුවෙන් හඳුන්වනු ලැබේ.

## අල් අදාන්   الأَذَان

اَللّٰهُ أَكْبَرُ . اللّٰهُ أَكْبَرُ
اَللّٰهُ أَكْبَرُ . اللّٰهُ أَكْبَرُ
أَشْهَدُ أَنْ لَّا إِلٰهَ إِلَّا اللّٰهُ
أَشْهَدُ أَنْ لَّا إِلٰهَ إِلَّا اللّٰهُ
أَشْهَدُ أَنَّ مُحَمَّدًا رَّسُولُ اللّٰهِ
أَشْهَدُ أَنَّ مُحَمَّدًا رَّسُولُ اللّٰهِ
حَيَّ عَلَى الصَّلَاةِ
حَيَّ عَلَى الصَّلَاةِ
حَيَّ عَلَى الْفَلَاحِ
حَيَّ عَلَى الْفَلَاحِ
اَللّٰهُ أَكْبَرُ اللّٰهُ أَكْبَرُ
لَا إِلٰهَ إِلَّا اللّٰهُ

අල්ලාහු අක්බර්   අල්ලාහු අක්බර්
අල්ලාහු අක්බර්   අල්ලාහු අක්බර්
අෂ්හදු ඇන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්
අෂ්හදු ඇන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්
අෂ්හදු ඇන්න මුහම්මදර් රසූලුල්ලාහ්
අෂ්හදු ඇන්න මුහම්මදර් රසූලුල්ලාහ්
හයිය අලස් සලාහ්   හයිය අලස් සලාහ්
හයිය අලල් ෆලාහ්   හයිය අලල් ෆලාහ්
අල්ලාහු අක්බර් අල්ලාහු අක්බර්


ලා ඉලාහ ඉල්ලල්ලාහ්

### ක්‍රියාකාරකම

ශිෂ්‍යයෙකු 'අදාන්' ලස්සනට කියන විට පංතියේ සිටින අනෙක් ශිෂ්‍යයන් නිහඬව සවන් දීම.

# 8 පිරිසිදුව සිටිමු

අපි නීරෝගී ව
ජීවත් වීමට පිරිසිදුව
සිටිමු.



අත්, පා, මුහුණ සෝදමු.

දිය නා ශරීරය පිරිසිදු
කරමු.



නිය පොතු කපමු.

හිස පීරා ලස්සන වෙමු.





ඇඳුම් පිරිසිදුව

තබා ගනිමු.

පිරිසිදුව සිටින්නට පාවහන් පළඳිමු.



නිවසේ දී භාවිතා කරන භාජන සෝදා පිරිසිදුව තබමු.



අප පිරිසිදුව සහ ලස්සනට සිටින විට අන් අය අපට ආදරය දක්වනවා ඇත.

එවිට අල්ලාහ් ද අපට කැමති ය.

අල්ලාහ් ලස්සන ය. ඔහු ලස්සනට කැමැති ය.

## අභ්‍යාස

හිස් තැන් පුරවන්න

1. දිය නා ශරීරය ..............................කරමු.

2. හිස .................................... ලස්සන වෙමු.

3. නියපොතු ........................... පිරිසිදුව සිටිමු.

# 9 පිරිසිදු කරමු

නිවස පිරිසිදුව තබමු.

පොත් පත්, ඇඳුම්, සෙල්ලම් බඩු ආදිය නියමිත තැන්වල තබමු.

නිවස අවට පරිසරය පිරිසිදුව තබා ගනිමු.



මල් වවා ලස්සන කරමු.

ඒවාට ජලය සපයා ආරක්ෂා කරමු.



යමෙක් පිරිසිදු කරන විට ඔවුන්ට උදව් කරමු.

අල්ලාහ් පාරිශුද්ධ ය. ඔහු පිරිසිදුකම ප්‍රිය කරයි.

## අභ්‍යාස

හරි (✓) වැරදි (✗) ලකුණු කරන්න

1) පිරිසිදු කරන්නන් ට උදව් කරමු. ( )

2) නිවාස පිරිසිදුව තබා ගනිමු. ( )

3) ඇඳුම් තැන තැන දමමු. ( )

# 10 යහපත් පිළිවෙත් පුරුදු වෙමු

කිවිසුම් යන විටත් කහින විටත් අත් ලේන්සුව භාවිත කරමු.



කිවිසුමකින් පසු නාසය සහ කට පිස දමමු. එවිට,

اَلْحَمْدُ لِلّٰهِ
අල්හම්දු ලිල්ලාහ්!

යැයි අල්ලාහ්ට ප්‍රශංසා කරමු.



වම් පැත්තට කර කෙළ ගසමු.

ඇනුම් අරින අවස්ථාවේ දී අතින් කට වසා ගනිමු. එවිට,

أعوذُ بِٱللَّهِ مِنَ ٱلشَّيْطَٰنِ ٱلرَّجِيمِ .

අඋඥු බිල්ලාහි මිනෂ්ෂයිතානිර් රජීම්

කියමු.

යහපත් පිළිවෙත් පුරුදු වෙමු.

හොඳ ළමයින් ලෙස ජීවත් වෙමු.

## අභ්‍යාස

යා කරන්න

| අ | ආ |
|---|---|
| කෑමට පෙර | අල්හම්දු ලිල්ලාහ් |
| කිවිසුමකින් පසු | අඌදු බිල්ලාහ් |
| ඇනුම ඇරීමෙන් පසු | බිස්මිල්ලාහ් |

# 11 පන්ති කාමරයේ පිරිසිදුකම සුරකිමු

පන්ති කාමරය පිරිසිදුව හා ලස්සනට තබාගනිමු.



පුටු, මේස පිළිවෙළට තබමු.

පන්ති කාමර බිත්ති කිලිටි නොකර තබා ගනිමු.

පොත් බෑගය, වතුර බෝතලය වැනි දේ නියමිත තැන්වල තබමු.

කුණු කසළ ඒවාට නියමිත ස්ථානවල පමණක් දමමු.

නිර්මාණ සියල්ල ම ලස්සනට ප්‍රදර්ශනය කරමු.

සෑම නිර්මාණයක් ම අගය කරමු.

ඒවා දැක සතුටු වෙමු.

"පිරිසිදුකම ර්මාන්හි අඩකි" යන්න පිළිගෙන ජීවත් වෙමු.

## අභ්‍යාස

යා කරන්න

| අ | ආ |
| --- | --- |
| පිරිසිදුකම ඊමාන් හි | රාක්කය |
| කුණු කසළ දමන්නේ | බිත්තිය |
| නිර්මාණ එල්ලා තබන ස්ථානය | අඩකි |
| පොත්, වතුර බෝතල් තබන ස්ථානය | කසළ බඳුන |

# 12 හොඳ පුරුදු පිළිපදිමු I



නින්දට පෙර දත් මදිමු.

නිදාගන්නා ස්ථානය පිරිසිදුව තබමු.

නින්දට පෙර ඇඳ ඇතිරිලි ගසා දමමු.

ඇඳ සූදනම් කර ගනිමු.

اَللّٰهُمَّ بِاسْمِكَ أَمُوْتُ وَأَحْيَا
අල්ලාහුම්ම බිස්මික අමූතු වඅහ්යා

යන දුආව පාරායනය කරමු.



දකුණු පැත්තට හැරී නිදා ගනිමු.



නින්දෙන් පසු අවදි වී

الْحَمْدُ لِلَّهِ الَّذِيْ أَحْيَانِيْ بَعْدَ مَا أَمَاتَنِيْ وَإِلَيْهِ النُّشُوْرُ

අල්හම්දු ලිල්ලාහිල්ලදී අහ්යානී බඃද මා අමාතනී වඉලයිහින් නුෂූර්

යන දුආව පාරායනය කරමු.

අල්ලාහ්ට ප්‍රශංසා කරමු.

ඉස්ලාමය පවසන මෙම යහමග අනුගමනය කරමු.

කුසල් රැස්කර ගනිමු.

## අභ්‍යාස

### පිළිවෙළට අංක කරන්න


- ★ දුආ පාරායනය ( )
- ★ දත් මැදීම ( )
- ★ ඇඳ සූදානම් කිරීම ( )
- ★ දකුණු පැත්තට හැරී නිදා ගැනීම ( )

# 13 හොඳ පුරුදු පිළිපදිමු II

වැසිකිළි යෑමේ දී ඉස්ලාම් පිළිවෙත් කිහිපයක් පෙන්වා දී ඇත. ඒවා ඉගෙන ගනිමු.

මලපහ කිරීමට වැසිකිළිය භාවිතා කරමු.

වම් පය ඉදිරියෙන් තබා වැසිකිළියට ඇතුළු වෙමු



اَللّٰهُمَّ إِنِّيْ أَعُوْذُ بِكَ
مِنَ الْخُبُثِ وَالْخَبَائِثِ

අල්ලාහුම්ම ඉන්නී
අඌදුබික මිනල්
හුබ්සි වල් හබාඉසි.

යන දුආව
පාරායනය කරමු.



එහි දී කතා කිරීමෙන් වළකිමු.

දකුණු පාදය ඉදිරියට තබා වැසිකිළියෙන් පිට වී පහත දුආව පාරායනය කරමු.

غُفْرَانَكَ

ගුෆ්රානක

සබන් දමා අත් හොඳින් සෝදා ගනිමු.





දෙපා ද හොඳින් සෝදා ගනිමු.

ඉස්ලාමීය ආචාර ධර්ම පිළිපදිමු.
නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම්
තුමාගේ මග පිළිපදිමු.

## අභ්‍යාස

හරි (✓) වැරදි (✗) ලකුණු කරන්න.

1. මල පහ කිරීමෙන් පසු අත් හොඳින් සෝදා ගනිමු. ( )
2. මල පහ කරන විට කතා කිරීම හොඳ පුරුද්දක් නොවේ. ( )
3. දකුණු පාදය ඉදිරියට තබා වැසිකිළියට ඇතුළු වෙමු. ( )

# 14 ආදරයෙන් සලකමු

අන් අයට ආදරයෙන් සලකමු.

අසල් වැසියන්ට ආදරයෙන් සලකමු.

අන් අයට උදවු කරමු.

සියලු සතුන්ට කරුණාව දක්වමු.



බාල අයට ආදරය කරමු.
වැඩිහිටියන්ට ගරු කරමු.



මේවා මුස්ලිම්වරු සතු උතුම් ගුණාංග වේ.
මේ අනුව ජීවත් වෙමු.

## අභ්‍යාස

හිස් තැන් පුරවන්න.

(අසල්වාසීන්, හිරිහැර, ආදරය, වැඩිහිටියන්)

01. අප නිවස අසල ජීවත්වන්නන් ...................... වේ.
02. නංගිලාට මල්ලිලාට ...................... දක්වමු.
03. ......................... ට ගරු කරමු.
04. සතුන්ට ............................ නොකරමු.

# 15 ආලිම්වරු

අල්ලාහ් දායාද කළ දැනුමත්
අප නබිඳුන්ගේ මාර්ගයත්
කියා පාන ආලිම්වරුනි!
ගරු කළ යුත්තා ඔබම වේ.



කුර්ආන් පාරායනයටත්
සදහම් දහම් උගැනුමටත්
විනය රකිමින් ජීවත් වන්ටත්
උගන්වන්නේ ඔබ ම ය.

දනුම සොයා එතුමන් වෙත
රැඳී ඉන්න ඔබත් එන්න
ලස්සන දිවියක් ගෙවීමට
සුදුසු ම මග එයයි සදා

## අභ්‍යාස

හරි (✓) වැරදි (×) ලකුණු කරන්න

(1) ආලිම්වරු ගරුත්වය හිමි අය වෙති. ( )

(2) ආලිම්වරුන්ට ළං වීමට තහනම් ය. ( )

3) ඔවුහු ජීවත්වීමට මග පෙන්වන්නෝ ය. ( )

4) ආලිම්වරු ආදර්ශමත් පුද්ගලයන් වේ. ( )

# 16 ගුරුවරයා



ජීවත් වන මග කියා දෙන
පාඩම් අප හට උගන්වන්නා
ගුරුවරයා යන ආලිම්වරයා
උගනිමු ඔහුගෙන් යහදේ සැමදා

අකුරු ඉලක්කම් උගන්වමින්
ලෝකය ගැන සැමදේ කියමින්
ඔහු වෙත යන අප සැමට හොඳින්
නැණ ගුණ දම් පහදයි සිතැතින්

කීකරු ව රැඳෙමින්
එතුමන්ට ගරු කරමින්
නබිගේ සුබ පැතුම් ලබමින්
අපිත් වෙමු හොඳ ළමයින්

## අභ්‍යාස

### හිස් තැන් පුරවන්න

(ගුරුවරයා, මග, ගරුකර)

01. ගුරුවරයා ජීවත් වීමට ..................... පෙන්වයි.
02. ..................... අකුරු, ඉලක්කම් උගන්වයි.
03. ගුරුවරුන්ට ......................... ජීවත් වෙමු.

# 17 ආදර්ශමත් දරුවා

'අහ්මද්' හොඳ දරුවෙක්
ලස්සන රුවක් ඇත්තෙක්
පිරිසිදු ව සිටින්නෙක්
ගුණවත් වූ දරුවෙක්

උදෑසනින් ඇහැරී සතුටින්
පාරායනාවන් නමදී බැතියෙන්
උනන්දුවෙන් පොත්පත් බලමින්
දවස ගෙවයි සැමදා සතුටින්

ඇත්ත ම විතරයි පවසන්නේ
අනුන්ට උදවු ද කරමින්නේ
අම්මට තාත්තට කරුණාවෙන්
සලකමිනුයි ජීවත් වන්නේ



ගුණවත් විදිහට ජීවත් වී
ඔහු වාගෙ ම හොඳ දරුවෙකු වී
අපිත් සිතමු ඒ විදියට ළමයින් වී
රටටත් ලොවටත් වැඩ ගෙන දී

## අභ්‍යාස

අහ්මද් ළඟ ඇති හොඳ ගුණාංග සඳහන් කරන්න

1. ............................................................................

2. ............................................................................

3. ............................................................................

4. ............................................................................

5. ............................................................................

# 18 උදවු කරමු

අපි

මව්පියන්ට උදවු කරමු.



සහෝදර සහෝදරියන්ට උදවු කරමු.



වැඩිහිටියන්ටත් බාලයන්ටත් උදවු කරමු.

අසල් වැසියන්ටත් යහළුවන්ටත් උදවු කරමු.

අසරණයන්ට පිහිට වෙමු.

සියලු සතුන්ට කරුණාව දක්වමු.



කුසල් කර ස්වර්ගයට පිවිසෙමු.
අකුසලින් වැළකී නිරයෙන් ආරක්ෂා වෙමු.

## අභ්‍යාස

යා කරන්න

| අ | ආ |
|---|---|
| 1. අකුසලින් වැළකී | කරුණාව දක්වමු. |
| 2. අසල්වැසියන්ටත් යහළුවන්ටත් | නිරයෙන් ආරක්ෂා වෙමු. |
| 3. සතුන්ට | උදවු කරමු. |

# 19 මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ පියා අබ්දුල්ලා ය.

එතුමා ඉපදෙන විට පියා මිය ගොස් සිටියේ ය.

එතුමාගේ මව ආමිනා ය.

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා "හලීමා" නම් කිරි මවගෙන් කිරි බීහ.

එතුමාට වයස අවුරුදු හය වන විට මව ද මරණයට පත් වූවා ය.

පසුව එතුමා අබ්දුල් මුත්තලිබ් ළඟ හැදී වැඩුණහ.

එතුමාට වයස අවුරුදු අට වන විට ඔහු ද මිය ගියේ ය.

ඉන් පසු මහප්පා වූ අබූතාලිබ් ළඟ හැදී වැඩුණේ ය.

එතුමා වැඩිහිටියකු වන තුරු ම ඔහු සමඟ වැඩුණහ.

## අභ්‍යාස

හිස්තැන් පුරවන්න.

1. මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ පියා ................. ය.
2. එතුමා ........................ නම් කිරි මවගෙන් කිරි බීහ.
3. මවගේ මරණයෙන් පසු ........................ ළඟ හැදී වැඩුණහ.
4. වැඩිහිටියෙකු වන තෙක් ...................... ළඟ හැදී වැඩුණහ.

# 20 අවසාන දේව ධර්ම දූතයාණෝ

නබි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අල්ලාහ්ගේ දේව ධර්ම දූතයා ය.

අවසාන දේව ධර්ම දූතයා එතුමා ය. එම නිසා එතුමාට "කාතමුන් නබි" යැයි ද පැවසෙයි.

එහි තේරුම "අවසාන නබිවරයා" යන්නයි.

එතුමාගේ නම සවන් දෙන අවස්ථාවල දී

එතුමාට අපි සලවාත් කියමු.

اَللّٰهُمَّ صَلِّ وَسَلِّمْ عَلَى سَيِّدِنَا مُحَمَّدٍ

وَعَلَى آلِ سَيِّدِنَا مُحَمَّدٍ

අල්ලාහුම්ම සල්ලි වසල්ලිම් අලා සෙයිදිනා මුහම්මදින් වඅලා ආලි සෙයිදිනා මුහම්මද්

ක්‍රියාකාරකම

නබි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට කියන සලවාතය පාඩම් කර කියන්න.

# 21 සියල්ලන්ගේ ම දේව ධර්ම දූතයාණෝ

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අල්ලාහ්ගේ දේව ධර්ම දූතයාණෝ ය.

එතුමාණෝ අරාබියාවේ මක්කා නගරයේ ඉපදුණහ.

එතුමාණෝ සියලු ජනතාවගේ දූතයාණෝ ය.

එතුමාණෝ මුළු ලොවට ම දේව ධර්ම දූතයාණෝ ය.

## අභ්‍යාස

හරි (✓) වැරදි (×) ලකුණු කරන්න

(1) නබි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අල්ලාහ්ගේ දේව ධර්ම දූතයාණෝ ය. (     )

(2) එතුමාණෝ මදීනාවේ ඉපදුණහ. (     )

(3) එතුමාණෝ සියලු ජනතාවගේ දේව ධර්ම දූතයාණෝ ය. (     )

(4) එතුමාණෝ අරාබි ජනයාට පමණක් දේව ධර්ම දූතයාණෝ ය. (     )

# 22 යහපත් ගුණාංග

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම්
තුමාණෝ වැඩිහිටියන්ට සැළකූහ.
වැඩිහිටියන්ට ගරු කළහ.

ඔවුන්ට කීකරු ව කටයුතු කළහ.

ඒ අයගේ ගෞරවයට ලක්වූහ.

බාලයන්ට සෙනෙහස දැක්වූහ.

ඔවුනට උදවු ද කළහ.

අපි ද වැඩිහිටියන්ට ගරු කරමු.

බාලයන්ට සෙනෙහස දක්වමු.

## අභ්‍යාස

පහත ඇති වැකිවලින් නිවැරදි අරුත් ඇති වැකි තෝරා ලියන්න

(1) වැඩිහිටියන්ට ගරු කළ යුතු ය.
(2) බාලයන්ට සෙනෙහස දැක්විය යුතු ය.
(3) වැඩිහිටියන්ට පමණක් උදවු කළ යුතු ය.
(4) වැඩිහිටියන්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.
(5) බාලයන්ට උදවු කළ යුතු ය.

1. ..........................................................................

2. ..........................................................................

3. ..........................................................................

4. ..........................................................................

5. ..........................................................................

23

# සූරතුල් ඉහ්ලාස්

## سُوْرَةُ الْإِخْلَاصِ




බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

කුල් හුවල්ලාහු අහද්.

අල්ලාහුස් සමද්.

ලම් යලිද්, වලම් යූලද්.

වලම් යකුල් ලහූ කුෆුවන් අහද්.

සූරතුල් ඉඛ්ලාස් අල්ලාහ් පිළිබඳ පමණක් පවසන සූරාවකි.

මෙම සූරාව පාරායනය කරමු.

එයට සවන් දෙමු.

එය කට පාඩම් කරමු.

### ක්‍රියාකාරකම

සූරතුල් ඉඛ්ලාස් කටපාඩම් කර කියන්න

# 24 මස්ජිද් I

මස්ජිද් ශුද්ධ වූ ස්ථානයක් වන්නේ ය.

එය අල්ලාහ්ගේ මාළිගාවයි.

එයට ඇතුළුවීමට පෙර අපගේ ශරීර ද ඇඳුම් ද පිරිසිදු කර ගත යුතු ය.



ගෞරවනීය ලෙස ඇඳුම් ඇඳගෙන යා යුතු ය.

මස්ජිදය තුළට ඇතුළු විය යුත්තේ පාවහන් ඉවත් කළ පසු ව ය.


දකුණු පාදය ඉදිරියට තබා ඇතුළු විය යුතු ය.

මස්ජිදයට ගරු කළ යුතු ය.

## අභ්‍යාස

හරි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( ✗ ) ලකුණ ද යොදන්න

1. මස්ජිදය ශුද්ධ වූ ස්ථානයකි. (  )
2. මස්ජිදය තුළට දකුණු පාදය තබා ඇතුළු විය යුතු ය. (  )
3. මස්ජිදය තුළට ඇතුළු විය යුත්තේ පාවහන් ඉවත් නොකර ය. (  )



# 25 මස්ජිද් II

මස්ජිදය තුළ නිහඬ ව සිටිය යුතු ය.

එහි සිටින විට වුළූ කර සිටීම යහපත් ය.

එහි දී පෙළට වාඩි වී සිටිය යුතු ය.

එහි ගරුත්වය රැක ගත යුතු ය.

එහි සලාතය ඉටු කරයි.



දේශනා ද පැවැත්වේ.

එහි දී වෙනත් හොඳ කටයුතු ද සිදු වෙයි.

අපි ද ඒවාට සහභාගි වී කුසල් ලබා ගනිමු.

## අභ්‍යාස

මස්ජිදය තුළ හැසිරිය යුතු ආකාරය පිළිබඳ ව පොත බලා ලියන්න.

1. ............................................................

2. ............................................................

3. ............................................................

4. ............................................................

5. ............................................................

# 26 ඉමාම් අබ්දුල් කාදිර් ජීලානි රහ්මතුල්ලාහි අලෛහි

ඉමාම් අබ්දුල් කාදිර් ජීලානි රහ්මතුල්ලාහි අලෛහි තුමා 'ජීලානි' යන ගමේ උපන්නේ ය.

ඔහුගේ පියා සෛයිද් අබූ සාලිහ් ය.

මව උම්මුල් කයිර් ය.

එතුමා කුඩා කාලයේ පටන් ම ඇත්ත කතා කරන්නෙක් විය.

මවට කීකරු ව ජීවත් වූවේ ය.

ඉගෙනීමට උනන්දු වූ ඔහු ඉගෙනුම සඳහා බග්දාද් නගරයට ගියේ ය.

බග්දාදයේ දී උගත් එතුමා උසස් විද්වතෙකු බවට පත් වූවේ ය.

එතුමා ජනතාවට දේශනා පැවැත්වූ වේය.

එම දේශනාවලට සවන් දුන් බොහෝ දෙනෙක් යහමගට හැරුණෝ ය.

ඉස්ලාමීය ලෝකවැසියන් එතුමාණන්ව අගයයි.

අපිත් හොඳින් ඉගෙන ගෙන උසස් තත්ත්වයකට පත්වෙමු.

අභ්‍යාස

(1) ඉමාම් අබ්දුල් කාදිර් රහ්මතුල්ලාහි අලෛහි තුමාගේ ගම ............ ය.

(2) ඔහුගේ පියා ......................... ය.

(3) ඔහුගේ මව ......................... ය.

(4) ඔහු ....................... නගරයේ ඉගෙනුම් ලැබුවේ ය.